**ශීර්ෂය 298 - මිනුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව**

---------------------------------------------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**

------------------

1.1 **තත්ත්වාගණනය කළ මතය**

----------------------------------

මිනුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මිනුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 මැයි **31** දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාල වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට මිනුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

-----------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

**---------------------------------------------------------------------------------------------------**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 **මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

**--------------------------------------------------**

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට

වංචා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී. .
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්**,** ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

1.6 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**--------------------------------------**

1.6.1 **ගිණුම්කරණ අඩුපාඩු**

**-----------------------**

**(අ) ආදායම් නොවන ලැබීම්**

| විගණන නිරීක්ෂණය<br>---------------------------- | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>------------------------------------ | නිර්දේශය<br>-------------------------- |
|---|---|---|
| (i) තැන්පතු ලැබීම්<br>------------------<br>මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ දක්වා ඇති තැන්පත් ලැබීම් රු.54,097 ක් දෙපාර්තමේන්තු පොත්වල ඇතුළත් කර නොතිබුණු අතර භාණ්ඩාගාර මුද්‍රිත සහ දෙපාර්තමේන්තු පොත් අතර වූ එම වෙනස අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ ඇතුළත් කර නොතිබුණි. | ඒකාබද්ධ ශේෂ පිරික්සුමට අනුව පොදු තැන්පත් ලැබීම රු. 111,890 ක් වන අතර තරාදි අළුත්වැඩියාකරුවන් නිෂ්පාදකයන්, ආනයනකරුවන් වාර්ෂික බලපත්‍රය අළුත්කිරීමේදී ගෙවිය යුතු ගාස්තුව මුද්දරවලින් ගෙවීමේදී එම වටිනාකමින් 2/3ක් රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් තැන්පත් ගිණුමට මාරු කර ඇත. ඒ අනුව මාරු කර ඇති මුදල රු. 54,097 ක් වේ. | භාණ්ඩාගාර මුද්‍රිත සහ දෙපාර්තමේන්තු පොත් අතර වූ වෙනස අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ ඇතුළත් කළ යුතුය. |

**(ආ) අග්‍රිම සැසඳුම් ප්‍රකාශය**

| විගණන නිරීක්ෂණය<br>-------------------------- | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>----------------------------- | නිර්දේශය<br>------------------------- |
|---|---|---|
| (i) භාණ්ඩාගාර 52 වගුවේ සහ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ අත්තිකාරම් ලැබීම් ලෙස රු.5,277,770 ක් දක්වා තිබුණු අතර | මාසික ගිණුම් සාරාංශ 298012 හා පරිගණක වාර්තා අනුව 298012 අතර වෙනසට හේතුව වන්නේ 298 ශීර්ෂයට යටතේ සිටි නිලධාරීන් ස්ථාන මාරු වි ගිය විට ඔවුන්ගේ ණය ශේෂ නිරවුල් කිරීමේදී | භාණ්ඩාගාර මුද්‍රිත සහ දෙපාර්තමේන්තු පොත් අතර වූ වෙනස අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ ඇතුළත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | දෙපාර්තමේන්තු පොත් අනුව එය රු.5,246,909 ක් විය. රු.30,861 ක් වූ වෙනස අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ ඇතුළත් කර නොතිබුණි. | 298012 යටතේ **CIGAS** පරිගණක වැඩසහනක් මඟින් වාර්තා නොකරන හේතුවෙනි. | |
| **(ii)** | අනෙකුත් ශීර්ෂ විසින් අත්තිකාරම් "බී" ගිණුමට කරන ලද බැර කිරීම් වටිනාකම රු.988,374 ක් වුවද අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ රු.1,002,511 ක් ලෙස සටහන් කිරීම හේතුවෙන් රු.14,137 ක වෙනසක් නිරීක්ෂණය විය. | සඳහන් කර ඇති වෙනස වන රු. 14,137 විශ්‍රාම ගිය H.P.C. විජේතිලක මයාගේ ණය ශේෂය නිරවුල් කිරීමය. එය භාණ්ඩාගාර මුද්‍රිත සටහන්වල 2021 සැප්තැම්බර් මස සටහන් කර ඇත. ඒ අනුව වෙනසක් නැත. | අග්‍රිම සැසඳුම් ප්‍රකාශය නිවැරදිව පිළියෙල කල යුතුය. |
| **(iii)** | අනෙකුත් ශීර්ෂ වෙනුවෙන් වාර්තා කරන ආයතනය විසින් අත්තිකාරම් **"බී"** ගිණුම වෙනුවෙන් කරන ලද බැර කිරීම් වටිනාකම රු.957,513 ක් අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ සටහන් කර නොතිබුණි. | නිවැරදි කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දෙන ලදී | අග්‍රිම සැසඳුම් ප්‍රකාශය නිවැරදිව පිළියෙල කල යුතුය. |

| | | |
|---|---|---|
| **(iv)** අනෙකුත් ශීර්ෂ වෙනුවෙන් වාර්තා කරන ආයතනය විසින් දරන ලද වියදම රු.69,137 ක් වුවද එය රු. 55,000 ක් වශයෙන් අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ දක්වා තිබුණි. | නිවැරදි කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දෙන ලදී | අග්‍රිම සැසඳුම් ප්‍රකාශය නිවැරදිව පිළියෙල කල යුතුය. |

**(ඇ) මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ ඒකාබද්ධ ශේෂ පිරික්සුමට අනුව අත්තිකාරම් අයකර ගැනීම් වටිනාකම රු.**4,275,258** ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ එම වටිනාකම ඇතුලත් කර නොතිබුණි. | අත්තිකාරම් අයකරගැනීම් මුදලින් හා හරස් සටහන් වලින් සිදුවේ. ඒ අනුව මුදලින් අයකර ගැනීම් රු.90,320 ක මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ වෙනත් ලැබීම් යටතේ දක්වා ඇත. හරස් සටහන් මගින් අය කරගැනීම් මුදලින් සිදු නොවන නිසා මුදල් ප්‍රවාහ ප්‍රකාශයට ඇතුලත් කර නොමැති බව දන්වා සිටිමි. | මුදලින් මෙන්ම හරස් සටහන් මගින් ද අයකර ගන්නා ලද අත්තිකාරම් වටිනාකම මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ඇතුලත් කළ යුතුය. |

### 1.6.2 විගණන සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ ඇතුළත් වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් | මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ වෙනත් ලැබීම් ලෙස ඇතුළත් වන්නේ අත්තිකාරම් “බී” | මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් තොරතුරු සම්බන්ධයෙන් ලිඛිත |

| | | |
|---|---|---|
| රු.731,500 සම්බන්ධයෙන් තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීය. | පොලිය, මාණ්ඩලික නිලධාරීන්ගේ දුරකථන දීමනා හා අධ්‍යක්ෂතුමාගේ ඉන්ධන දීමනා 1003 වැය විෂයයට අධිභාර කිරීම් හා වැඩිපුර ගෙවූ දීමනා නැවත ගෙවීම, 1001 වැය විෂයයට අධිභාර, දෙපාර්තමේන්තු අරමුදලට කළ බැර කිරීම්, වැටුප් බැංකුගත කිරීමෙන් පසු ගිණුම් අංකය වෙනස්වීම හේතුවෙන් අගරු වූ වැටුප් ආදියෙහි එකතුවකි. | සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

## 2 මූල්‍ය සමාලෝචනය

-------------------------

### 2.1 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

-----------------------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීන්ෂණය වූ නීති , රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිරීක්ෂණය | | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම | | |
| | | රු. | | | |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | | |
| (i) | මුදල් රෙගුලාසි 427 (2) | 1,100,000 | සෑම දෙපාර්තමේන්තුවක් විසින්ම භාණ්ඩාගාර පොත්වල දැක්වෙන ගිණුම් සමග තම දෙපාර්තමේන්තුවේ පවත්වාගෙන යන අග්‍රිම ගිණුම් මාසිකව සැසදිය යුතු වුවද, ඒකාබද්ධ ශේෂ පිරික්සුමේ අග්‍රිම ගිණුමෙහි හර ශේෂය සහ මාසික ගිණුම් සාරාංශය අනුව හර ශේෂය අතර රු 29,427 ක වෙනසක් | භාණ්ඩාගාරයෙන් ලද අග්‍රිම ප්‍රමාණය රු.155,800,000 කි.වෙනත් මූලාශ්‍රවලින් ලැබීම් රු.806,552.46 කි. එහිදී දෙපාර්තමේන්තු අරමුදලට ගෙවූ රු. 2,030 ක මුදල ඇතුළත් වේ. එම මුදල ඉවත් කළ විට වෙනත් මූලාශ්‍රවලින් ලැබීම් රු.804,522.46 කි. එවිට මුළු අග්‍රිම ලැබීම් වන්නේ රු.156,604,522 කි. එය ඒකාබද්ධ ශේෂ පිරික්සුමේ අග්‍රිම ගිණුමේ හර ශේෂයට සමාන වේ.<br>එමෙන්ම රු.25,580 ක | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | නිරීක්ෂණය වූ අතර ඒකාබද්ධ ශේෂ පිරික්සුමේ අග්‍රිම ගිණුමෙහි බැර ශේෂය සහ මාසික ගිණුම් සාරාංශය අනුව බැර ශේෂය අතර රු 1,100,000ක වෙනසක් නිරීක්ෂණය විය. | වටිනාකමක් දුම්රිය දෙපාර්තමේන්තුවට (306 ශීර්ෂය) ගෙවූ මුදල බව දන්වමි.<br>උක්තව දක්වා ඇති පැහැදිලි කිරීම අනුව රු.1,100,000 ක වෙනසට හේතුව සනාථ වේ. | |
| **(ii)** | මුදල් රෙගුලාසි 571 | 47,715,046 | වර්ෂ 02 ඉක්ම වූ රු. 47,715,046 ක් වූ ඉකුත් තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | පිළිතුරු සපයා නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයන් සිදුකර එම වාර්තා 2022 මාර්තු 31 දිනට පෙර විගණනය වෙත ඉදිරිපත් කල යුතු වුවත් එසේ කටයුතු කර නොතිබුණි. | 2021 වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණ කටයුතු මේ වන විට සිදුකරමින් පවතින අතර එය කඩිනමින් අවසන් කර අදාල වාර්තා විගණනයට ඉදිරිපත් කරන බව දන්වා සිටිමි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**2.2 තැන්පතු ශේෂයන්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ජංගම වගකීම් යටතේ දක්වා තිබුණු රු. 47,715,046 ක් වූ තැන්පතු ගිණුම් ශේෂය දෙපාර්තමේන්තු පොත් වල සටහන් කර නොතිබුණි. | තැන්පතු ලෙජරයේ සටහන් කිරීමට අතපසු වී ඇති අතර එය නිවැරදි කිරීමට කටයුතු කළෙමි. | දෙපාර්තමේන්තු ගිණුම් නිවැරදිව පිළියෙල කල යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 සැලසුම් කිරීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| **2020** අගෝස්තු **28** දිනැති අංක **02/2020** දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ **03** ඡේදයට අදාල වූ මාර්ගෝපදේශ අංක **12** ප්‍රකාරව **2021** වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු ක්‍රියාකාරි සැලැස්මේ ආයතනයේ යාවත්කාලින කල සංවිධාන ව්‍යුහය ඇතුලත් කර නොතිබුණි. | 2022 වර්ෂය සඳහා පිළියෙල කරන ක්‍රියාකාරි සැලැස්ම සමඟ යාවත්කාලීන කළ ආයතනයේ සංවිධාන ව්‍යුහය ඉදිරිපත් කිරීමට කටයුතු සිදු කරමින් පවතී. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ක්‍රියාකාරි සැලැස්මේ ආයතනයේ යාවත්කාලින කල සංවිධාන ව්‍යුහය ඇතුලත් කළ යුතුය. |

**3.2** **වාර්ෂික කාර්යසාධන වාර්තාව**

---------------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 ( 2 ) උප වගන්තියට අනුව සෑම අස්ථිත්‍යයක් විසින්ම එහි වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ වාර්ෂික කාර්යසාධන වාර්තාවද විගණකාධිපති වෙත ඉදිරිපත් කලයුතු වුවද එසේ කටයුතු කර නොතිබුණි. | 2020 කාර්යසාධන වාර්තාව මුද්‍රණයේ පවතී. 2021 වාර්ෂික කාර්යසාධන වාර්තාවේ සෝදුපත් පරීක්ෂා කටයුතු සිදු කරමින් පවතින අතර, එම වාර්තාවන් කඩිනමින් විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ වාර්ෂික කාර්යසාධන වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. |

**4.** **මානව සම්පත් කළමනාකරණය**

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 දෙසැම්බර් 31 දිනට ජ්‍යෙෂ්ඨ මට්ටමේ අනුමත කාර්ය මණ්ඩලය 19 ක් වූ අතර නියෝජ්‍ය අධ්‍යක්ෂ සහකාර අධ්‍යක්ෂ තනතුරු 08 ක් එනම් සියයට 42 ක් වසර 10 ක කාලයක් තිස්සේ පුරප්පාඩුව පැවතුණි. | මෙම පුරප්පාඩු සම්බන්ධයෙන් රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් දැනුවත් කර තිබුණද, මෙම තනතුරුවලට බඳවා ගැනීම් සඳහා වන ගැසට් නිවේදනවලට අප දෙපාර්තමේන්තුවේ තොරතුරු ඇතුළත් කර නොතිබුණි. අමාත්‍ය මණ්ඩල තිරණය ක් මඟින් රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාතුමාගේ නිරීක්ෂණ මත කටයුතු කිරීමට අනුමැතිය ලැබී තිබුණි .ඒ අනුව ඉහත පුරප්පාඩු 08 න් | තනතුරු පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | සීමිත එක් බඳවා ගැනීමක් සඳහා ගැසට් නිවේදනය සංශෝධනය කරන ලද අතර,රාජ්‍ය සේවා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාතුමාගේ නිරීක්ෂණ අනුව විවෘත බඳවා ගැනීමට අදාල තනතුරු 07 සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් මේ වන තෙක් කටයුතු කර නොමැත. | |
| (ආ) | අනුමත තෘතීයික මට්ටමේ තනතුරු **30**ක් අතුරින් **26** ක් එනම් සියයට **86** ක් වසර **3** ක කාලයක සිටම පුරප්පාඩුව පැවතුණි. මෙම කාර්ය මණ්ඩල පුරප්පාඩු දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය සඳහා අහිතකරව බලපානු ලබන අතර ඒ සම්බන්ධයෙන් සමාලෝචනය කර කාර්ය මණ්ඩල පුරප්පාඩු සම්පූර්ණ කිරීමට හෝ අනුමත කාර්ය මණ්ඩලය අවශ්‍යතාවය පරිදි සංශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | පරිපාලන නිළධාරී තනතුර 2017.01.20 දිනෙන් පසු පුරප්පාඩුව පවතී. ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙතින් පුරප්පාඩු පිරවීම සම්බන්ධව ඉල්ලීමක් කර ඇත. වැඩබලන පරිපාලන නිළධාරීයකු දැනට සේවයේ සිටී. 2018 වර්ෂයේදී තාක්ෂණික සේවයේ විශේෂ ශ්‍රේණියේ තනතුරු පුරප්පාඩු 21 ක් සඳහා බඳවා ගැනීමට සම්මුඛ පරීක්ෂණ පවත්වා ඇති අතර සහකාර අධිකාරී තනතුරු 04 පුරප්පාඩු පවතී. | තනතුරු පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. |